**ශීර්ෂය 123 - ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබද පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශිර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| **309** | **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව** |
| **310** | **රජයේ කර්මාන්ත ශාලාව** |
| **311** | **ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව** |

**1.1 විගණන විෂය පථය**

ඉහත 1 ඡේදයේ සඳහන් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, වාණිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව පහත සඳහන් දිනවල එම අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| -------- | ---------------------------------------------- | ------------------------- |
| 123 | **ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය** | 2015.07.20 |
| 309 | **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව** | 2015.07.08 |
| 310 | **රජයේ කර්මාන්තශාලාව** | 2015.09.14 |
| 311 | **ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව** | 2015.07.10 |

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම, වානිජ අත්තිකාරම් ගිණුම, ගබඩා අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම්

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක් සඳහා සළසා තිබුණු රු.මිලියන 5,310.09 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,964.25 ක් උපයෝජනය කළ පසු ඉතිරිය රු.මිලියන 2.07 ක සිට රු.මිලියන 1,316.60 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් හෙවත් **ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.69 ක සිට සියයට 28.37 ක් දක්වා පරාසයක ප්‍රමාණයන්ගෙන් පැවැතුණි.** විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 123 | 4,639.80 | 3,323.20 | 1,316.60 | 28.38 |
| 309 | 298.61 | 296.54 | 2.07 | 0.69 |
| 310 | 208.63 | 186.37 | 22.26 | 10.67 |
| 311 | 163.05 | 158.14 | 4.91 | 3.01 |
| **එකතුව** | **5,310.09** | **3,964.25** | **1,345.84** | **25.34** |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 03 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 12301 | 7.00 | 6.85 | 4.00 | 7.65 | 40.00 | 23.65 |
| 30901 | 18.00 | 15.75 | 12.00 | 15.91 | 85.00 | 46.01 |
| 31001 | 22.00 | 21.98 | 18.00 | 19.47 | 120.00 | 85.68 |
| 31101 | 11.00 | 10.11 | 6.80 | 8.11 | 90.00 | 32.27 |

## 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවක් විසින් වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක් පවත්වා තිබුණි.

### (අ) පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවක වාණිජ අත්තිකාරම් ගිණුම් දෙකක් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | බැරකම් | |
|---|---|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 31003 | 450.00 | 441.36 | 290.00 | 478.98 | 180.00 | 104.31 | 5.00 | 0.88 |
| 31002 | 170.00 | 144.05 | 120.00 | 188.95 | 40.00 | 33.20 | 20.00 | 23.37 |

### (ආ) මූල්‍ය ප්‍රතිඵල

රජයේ කර්මාන්ත ශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම හා කළවැඩ අත්තිකාරම් ගිණුම ලෙස වාණිජ අත්තිකාරම් ගිණුම් 02 ක් පවත්වා ගෙන යන අතර වර්ෂ අවසානයේ ගබඩා අත්තිකාරම් ගිණුමේ ඌනතාවය හෝ අතිරික්තය කළවැඩ අත්තිකාරම් ගිණුමට මාරුකරනු ලැබේ. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | මූල්‍ය ප්‍රතිඵල | | | |
|---|---|---|---|---|---|
| | | 2014 | | 2013 | |
| | | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව | ලාභය කල්පිත ගාස්තු රහිතව | ලාභය කල්පිත ගාස්තු සහිතව |
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 31002 | ගබඩා අත්තිකාරම් ගිණුම | 3.15 | 3.04 | 36.47 | 36.36 |
| 31003 | කළවැඩ අත්තිකාරම් ගිණුම | 5.10 | 4.90 | 25.44 | 25.24 |

## 2.3 අග්‍රිම ගිණුම්

-------------

අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයන්ගේ එකතුව රු.මිලියන 20.59 ක් විය. විස්තර පහත දැක්වේ.

| දෙපාර්තමේන්තුව | අග්‍රිම ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. මිලියන |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 7002/0000/000/0067/0014 | 9.97 |
| රජයේ කර්මාන්තශාලාව | 7002/0000/000/0043/0014 | 10.62 |
| | | ------- |
| **එකතුව** | | **20.59** |
| | | ==== |

## 2.4 පොදු තැන්පත් ගිණුම්

----------------------

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 03 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂවල එකතුව රු.මිලියන 684.33 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | **රු.මිලියන** |
| ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය | 6000/0000/0015/0079/000 | 0.51 |
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0163/000 | 99.78 |
| | 6000/0000/00/0015/0176/000 | 579.11 |
| රජයේ කර්මාන්තශාලාව | 6000/0000/00/0015/0164/000 | 4.20 |
| ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0165/000 | 0.73 |
| | | ----------- |
| | | **684.33** |
| | | ===== |

**2.5 විගණන නිරීක්ෂණය**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, වාණිජ අත්තිකාරම් ගිණුම්, ගබඩා අත්තිකාරම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 6 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශිර්ෂය 123 - ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය**

**3.1 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 10 ක් සඳහා රු.1,196,857,870 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 94 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 12301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාව අනුව එදිනට වර්ෂ 01ක සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක් තුළ අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.500,310 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

**3.3 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබුණත් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 24 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 04 | 01 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 107 | 99 | 08 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 41 | 03 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 02 | - | 02 |
| | **එකතුව** | **182** | **167** | **17** | **02** |

**4. ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

**4.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | යාවත්කාලීන කර නොතිබුණි. |

**4.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

-------------------------------------------

වැය විෂයයන් 6 ක් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනයන් කළ පසු ඉතිරිය රු.47,957 ක් වී තිබුණත්, මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව එම ඉතිරිය රු.1,474,035 කින් ඉක්මවා රු.1,521,992 ක බැරකම්වලට එළඹ තිබුණි.

**4.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට වර්ෂ 01 ක සිට වර්ෂ 09 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එන එකතුව රු.1,810,088 ක් වූ ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(ආ) 2005 දෙසැම්බර් 23 දින හා 2013 ජුනි 07 දින සේවය හැර ගිය නිලධාරියකුගෙන් හා සේවකයකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.367,002 ක හා රු.37,160 ණය ශේෂ නිලධාරියාගෙන් හා සේවකයාගෙන් හෝ වගකිව යුතු පාර්ශවයන්ගෙන් හෝ අයකර ගැනීමට 2015 ජුනි මාසය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 මාර්තු 17 දින විශ්‍රාම ගිය නිලධාරිනියකුගේ රු.238,330 ක ණය ශේෂය නිරවුල් කරගැනීමට දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

**4.4 කාර්යසාධනය**

---------------

**සැලැසුම් කිරීම**

-----------------

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරික්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 8,598.72 ක ව්‍යාපෘති 10 ක් නිම කිරීමට සැලැසුම් කර තිබුණද, එම ව්‍යාපෘති කිසිවක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළ රු.මිලියන පහකට වැඩි ව්‍යාපෘති 51 ක් සඳහා එකතුව රු.මිලියන 2,643.56 ක් වැය කර තිබුණත්, එම ව්‍යාපෘති ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කර නොතිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 76 | 40 |
| (ii) | තෘතියික මට්ටම | 23 | 07 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 273 | 176 | 97 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 177 | 138 | 39 |
| | **එකතුව** | **589** | **397** | **192** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 192 ක් පැවැතියත්, එය දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපා නොතිබුණි.

**5. ශිර්ෂය 310 - රජයේ කර්මාන්තශාලාව**

**5.1 විසර්ජන ගිණුම**

**5.1.1 අයවැය විචලනය**

වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු.21,372,774 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 ක සිට සියයට 50 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 5.1.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව, වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.42,164 ක් වී තිබුණත්, මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව එම ඉතිරිය රු.748,726 කින් ඉක්මවා රු.790,890 ක බැරකම්වලට එළඹ තිබුණි.

### 5.3 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.690,054 ක තැන්පතු 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 5.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 31001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,308,264 ක් වූ අතර ඉන් රු.1,905,405 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 3 ක් දක්වා කාල පරාසයක සිටද හා ඉතිරි රු.1,402,859 ණය ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක සිට ද පැවැත එමින් තිබුණත්, එම හිඟ හිට ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) එක් නිලධාරියකුගේ රු.15,850 ක ණය ශේෂයට අදාල ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 5.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 5.5.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් එවැනි ක්‍රියාකාරී සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කර නොතිබුණි.

**5.5.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

මුදල් රෙගුලාසි 133 හා 2009 ජනවාරි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 03 ඡේදයෙහි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ ගනුදෙනු හා ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් හෝ පරීක්ෂා කර නොතිබුණි.

**5.6 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**5.6.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**--------------------------------------**

කොලොන්නාව රජයේ කර්මාන්ත ශාලාව පිහිටි අක්කර 15 ක ඉඩමෙන් රූඩ් 01 පර්චස් 16 ක් පමණ වූ බිම් කොටසක් වර්ෂ 50 කට අධික කාලයක සිට අනවසර පදිංචිකරුවන් භුක්තිවිඳින බව නිරීක්ෂණය විය.

**5.7 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 21 | 16 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 157 | 126 | 31 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 434 | 351 | 83 |
| | **එකතුව** | **619** | **498** | **121** |

**6. ශීර්ෂය 311 - ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව**

**6.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**6.2 විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයයන් 13 කට රු.3,087,918 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක සිට සියයට 100 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විගණනයට ඉදිරිපත් කළ විෂය අංක 31101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු රු.2,735,174 ක ශේෂවලින් වසර 05 ඉක්ම වූ රු.514,073 ක හිඟහිටි ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

**6.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවට අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් හෝ දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර නොතිබුණි.

**6.5** කාර්යසාධනය

1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතට අනුව පිහිටවූ නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, 2000 අංක 49 දරන සංශෝධිත නගර හා ග්‍රාම නිර්මාණ පනතට අනුව ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව බවට පත් කර තිබුණි. මෙම දෙපාර්තමේන්තුවේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සැලැසුම් සකස් කිරීමට පමණක් සීමා කර තිබුණි. එම සැලැසුම් ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම කර නොතිබිම නිසා දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

**6.6** මානව සම්පත් කළමනාකරණය

**----------------------------------**

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

**---------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 10 | 30 |
| (ii) | තෘතියික මට්ටම | 07 | 02 | 05 |
| (iii) | ද්විතියික මට්ටම | 141 | 77 | 64 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 225 | 202 | 23 |
| | **එකතුව** | **413** | **291** | **122** |